# ඉඩම් අමාත්‍යාංශය

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## තක්සේරු නිලධාරී තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පුරප්පාඩු පවතින තක්සේරු නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුර : තක්සේරු නිලධාරී

   1.1 තනතුරු සංඛ්‍යාව : 03

2. වැටුප් පරිමාණය : 32200/-445X10-660X11-730X10-750X5-54960

   2.1 මාසික මූලික වැටුප : 32200

3. වයස : අවුරුදු 22 - 45 දක්වා

4. සුදුසුකම්

   4.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තක්සේරුකරණය පිළිබඳ උපාධියක් ලබාතිබීම.

   4.2 රජයේ හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක තක්සේරුකරණය පිළිබඳව සේවා පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

5. ඉහත සඳහන් සුදුසුකම් වලින් හෙබි අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත්ද සහිතව 2021.02.03 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර ලුහුඬු ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යාවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරා ගතහොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.

8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**තක්සේරු නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය**" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

**සභාපති,**
**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,**
**අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2021.01.13**